**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2022**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 15 ඡේදය මඟින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 877(1)(ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛණය සකස් කොට තිබුණද, අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට එලෙස කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය | 2022 වර්ෂය සඳහා අරමුදල විසින් රු.8,318,010 ක් වූ පරිගණක ඇතුළුව ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.652,757,142 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 221,057,494 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 431,699,648 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රතිලාභීන්ගේ දායක මුදල් වැඩි කිරීම හා ආයෝජන පොලී ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි මාලාව අනුව සෑම දිනුම් ඇදීමක් සිදුකිරීමට පෙර ඒ ඒ මාසයේ සමෘද්ධි සහනාධාරයෙන් ඉවත් වූ සහ අළුතින් සහනාධාර ලැබූ ප්‍රතිලාභීන්ගේ තොරතුරු පරිගණක දත්ත සමුදායට ඇතුළත් කර සමෘද්ධි සහනාධාරලාභී නාමලේඛන ප්‍රතිලාභ කළමනාකරණ මොඩියුලය තුළින් තොරතුරු යාවත්කාලීන කලයුතු වුවත්, එසේ යාවත්කාලීන නොකිරීම මත 2022 වර්ෂයේදී ප්‍රතිලාභීන් 84 ක ගේ ත්‍යාග මුදල් අත්හිටුවා තිබුණි. ඒ අනුව නිවැරදි යාවත්කාලීන කිරීම් ප්‍රමාද වීම මත වෙනත් ප්‍රතිලාභියකුට ජයග්‍රහණයක් හිමිවීමේ අවස්ථාව අහිමි වීමෙන් රු. 16,800,000 ක ත්‍යාග මුදල් ලබාදීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට වගබලා ගන්නා ලෙස CRM පද්ධතිය භාර තොරතුරු තාක්ෂණ අංශයේ පද්ධති විශ්ලේෂක වෙත උපදෙස් ලබාදෙන ලදී.<br>මේ වනවිට එක් වරක් දිනුම් අදිනු ලැබූ ජයග්‍රාහකයින් හට ත්‍යාග ලබාදීමෙන් පසු එම නාමලේඛනය වෙනම ගොනුවකට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. | දත්ත පද්ධතිය යාවත්කාලීන කර ප්‍රතිලාභීනගේ ත්‍යාග මුදල් ලබාදීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 පෙබරවාරි 01 දිනැති සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල රෙගුලාසි මාලාවේ 26 වන ඡේදය ප්‍රකාරව සෑම දිනුම් ඇදීමක්ම අවසානයේ එම දිනුම් ඇදීම සිදුකල දින සිට මාස 03 ක් ගතවන කල් පමණක් ත්‍යාග ලබාදීම සිදුකල යුතු අතර ලබාදීමට අපොහොසත් වන ත්‍යාග සඳහා ඉතිරි වන මුදල් එම කාලසීමාව අවසානයේ ප්‍රධාන කාර්යාලයේ නිවාස ලොතරැයි අරමුදල් ගිණුමට බැරකල යුතුය. එසේ වුවද, ඊට පටහැනිව ත්‍යාග 46 කට අදාළ රු. 9,200,000 ක මුදලක් මාස 04 සිට මාස 13 ක් දක්වා කාල ප්‍රමාදයක් සහිතව අරමුදලට බැර කර තිබුණි. | සෑම ජයග්‍රාහී ත්‍යාගයක්ම ඉතා කඩිනමින් ලබාදීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් ශේෂයක් වේ නම් ප්‍රධාන කාර්යාලයට ලබාදෙන ලෙස සෑම ත්‍යාග මුදල් නිදහස් කිරීමක් සමඟම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ලිපියක් මගින් දන්වා ඇත. නමුත් ක්‍රියාත්මක කිරීමේදී බොහෝ පුද්ගලයින් විවිධ හේතු ඉදිරිපත් කරමින් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුදල් තබා ගනිමින් වර්ෂය අවසානයේදී ප්‍රධාන කාර්යාලයේ නිවාස ලොතරැයි ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ඇත. | ත්‍යාග සඳහා වන ඉතිරි මුදල අදාල කාල සීමාව ඇතුලත ප්‍රධාන කාර්යාලයේ නිවාස ලොතරැයි අරමුදල් ගිණුමට බැරකල යුතුය. |
| (ඇ) | විශේෂ නිවාස ආධාර යටතේ අවධානය යොමු කළ යුතු අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම වෙනුවෙන් සමෘද්ධිලාභීන්ගේ මාසික දායකත්වයෙන් ගොඩනැඟී ඇති මෙම අරමුදලින් සමෘද්ධිලාභීන් නොවන පුද්ගලයින්ද ඇතුලත්ව 2,999 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.947,775,000 ක් වූ විශේෂ නිවාස ආධාර ලබාදී තිබුණි. | සමෘද්ධි වැඩසටහන යටතේ මෙම විශේෂ නිවාස වැඩසටහන දිළිඳු ප්‍රජාව උදෙසා ක්‍රියාත්මක කිරීමක් වන බැවින් ඒ සඳහා නිවාස යෝජනා තෝරාගැනීමේදී සමෘද්ධි සහනාධාර ලබන පුද්ගලයන් හා ප්‍රමුඛතාගත ලැයිස්තු අනුව අඩු ආදායම්ලාභීන්ද මේ සඳහා තෝරා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල එකඟතාවය අනුව මෙලෙස නිවාස ආධාර ලබාදීම සිදු කර ඇත. | නිවාස ආධාර ලබාදීමේදී අරමුදලේ දායකත්වය දරන සමෘද්ධිලාභීන්ට ප්‍රමුකත්වය ලබාදීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 15 ඡේදය මඟින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි877(2) ඇ ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 ජුනි 07 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය විගණනය කිරීමෙන් අනතුරුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කොට ඉදිරිපත් කිරීම නිසා කාල පමාව සිදු වී ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |